# සංක්ෂිප්තය

සෑම වසරකම ලොව පුරා මිනිසුන් 873,000 ක් පමණ සිය දිවි නසා ගනී. සිය දිවි නා ගැනීමට තැත් කිරීම් ගණන මිලියන 10 ත් 20 ත් අතර මට්ටමක පවතී. ලෝක සෞඛ්‍ය සංවිධානය පෙන්වා දෙන අන්දමට ලොව පුරා සිටින වයස අවුරුදු 15 - 19 ත් අතර පසුවන නව යෞවනයන් මිය යාමට හේතුවන ප්‍රධානම කරුණු 05 අතරට සිය දිවි නසා ගැනීම අතුළත්ය. බොහෝ රටවල මෙය පළමුවන හෝ දෙවන හේතුව බවට පත්ව තිබේ.

ශ්‍රී ලංකාව තුළ දිනකට සිය දිවි නසා ගැනීම් 14 ක් පමණ සිදුවේ. මෙයින් 40% ක් පමණ වයස අවුරුදු 15 ත් 24 ත් අතර පසුවන්නන්ය. කවර හේතුවක් නිසා හෝ පුද්ගලයකු අකාලයේ මිය යාම රටකට බලවත් පාඩුවකි. බොහෝ විට සිය දිවි නසා ගැනීමට යොමුවන හේතුන් වලට කල් තබා පිළියම් යෙදීමට හැකිවේනම් එම මරණ බොහොමයක්ම වලක්වා ගැනීමට හැකියාව තිබේ. එසේවුවද ශ්‍රී ලංකාවේ එය වැළැක්වීම සම්බන්ධයෙන් ගෙන තිබෙන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සතුටු විය නොහැක.

නව යොවුන් විය පුද්ගලයෙකුගේ ජීවිතයේ වැදගත්ම පරිවර්තන කාල පරිච්ඡේදයක් සේ සැලකේ. පුද්ගලයකු නව යොවුන් වියේ දී මුහුණපාන බොහෝ ගැටලු පැවතිය හැකිය. මෙම ගැටලුවලට සාර්ථක විසඳුම් නොලැබුණහොත් ඔවුන් සිය දිවි නසා ගැනීමක් පිළිබඳ සිත යොමු කළ හැකි ය. එබැවින් මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ නව යොවුන් වියේ පසුවන ළමුන් සිය දිවි නසා ගැනීමට යොමුවීම කෙරෙහි බලපාන හේතු හඳුනා ගැනීමයි. නව යොවුන් වියේ පසුවන ළමුන් සිය දිවි නසා ගැනීමට යොමුවීම කෙරෙහි බලපාන හේතු ගැහැණු පිරිමි භේදය අනුව වෙනස් වන්නේ දැයි විමසා බැලීම, සිය දිවි නසා ගැනීමට උත්සාහ කළ ද ජීවිතය බේරුණු ළමුන් එයින් පසු මුහුණ දෙන ගැටලු හඳුනා ගැනීම හා සිය දිවි නසා ගැනීමට යොමුවූවන් ඉන් මුදවා ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක වන ක්‍රමවේදයන් හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ අනෙකුත් අරමුණු අතර වේ. නව යෞවනයන් සිය දිවි නසා ගැනීම වැළැක්වීම සම්බන්ධයෙන් ගත හැකි පිළියම් යෝජනා කිරීමට ද මෙම අධ්‍යයනයෙන් බලාපොරොත්තු වේ.

සමීක්ෂණ පර්යේෂණ ක්‍රමයට හා ප්‍රත්‍යක්ෂ අධ්‍යයන ක්‍රමයට අනුව කරනු ලැබූ මෙම අධ්‍යයනයේ දී නියැදිය වශයෙන් යොදා ගන්නා ලද්දේ බදුල්ල දිස්ත්‍රික්කයේ ජදිංචි සිය දිවි නසා ගැනීමට තැත් කළ නව යෞවනයන් 50 දෙනෙකි. ඊට අමතරව සිය දිවි නසා ගත් නව යෞවනයන් 10 දෙනෙකු පිළිබඳව දත්ත එක් රැස් කොට විශ්ලේෂණය කරන ලදි.

මෙහි පළමුවන පරිච්ඡේදයෙන් නව යෞවනයන් සිය දිවි නසා ගැනීමට යොමුවීම නිසා මතුව ඇති ගැටලුවේ ස්වභාවයත්, එම ගැටලුව අධ්‍යයනයේ ඇති වැදගත් කමත් පිළිබඳව කරුණු ඉදිරිපත් කර තිබේ. එම ගැටලුව හා බැඳුණු සමාජ, ආර්ථික හා මනෝ විද්‍යාත්මක පසුබිම හා ඒ සම්බන්ධයෙන් මෙතෙක් සිදුකොට ඇති අධ්‍යයනයන් පිළිබඳ සාහිත්‍ය විමර්ශනයක් දෙවන පරිච්ඡේදය මගින් ඉදිරිපත් කර තිබේ.

මෙහි තුන්වන පරිච්ඡේදය වෙන් කර ඇත්තේ අධ්‍යයන ක්‍රමවේදය විස්තර කිරීම සඳහා ය. එහිදී මෙම අධ්‍යයනය සඳහා නියදිය තෝරා ගත් ආකාරය පිළිබඳවත්, දත්ත රැස් කිරීම සඳහා යොදා ගත් උපකරණ හා ක්‍රම ශිල්ප පිළිබඳවත් විස්තර ඉදිරිපත් කර ඇති අතර දත්ත රැස් කිරීම සඳහා යොදා ගත් උපකරණයන් උපලේඛනයන් ලෙස ඉදිරිපත් කර තිබේ. තවද මෙම අධ්‍යයනයේ දී පර්යේෂණ ආචාර ධර්ම සුරැකීමට ගත් උත්සාහය පිළිබඳව හා මෙම අධ්‍යයනයේ සීමාවන් පිළිබඳව ද මෙම පරිච්ඡේදයෙන් විස්තර කර තිබේ.

මෙම අධ්‍යයනයේ දී රැස් කර ගනු ලැබූ දත්ත ඉදිරිපත් කිරීම හා විශ්ලේෂණය කිරීම වෙනුවෙන් හතර වන පරිච්ඡේදය වෙන් කර තිබේ. දත්ත විශ්ලේෂණය සඳහා වගු, ප්‍රතිශත හා ප්‍රස්තාර භාවිත කර ඇත. පස් වන පරිච්ඡේදයෙන් මෙම අධ්‍යයනය තුළින් එළඹිය හැකි නිගමනයන් හා එයට අදාළව ගත හැකි පිළියම් පිළිබඳ යෝජනා ඉදිරිපත් කර තිබේ. එසේම අනාගත පර්යේෂකයින් සඳහා වන යෝජනාවන් ද මෙම පරිච්ඡේදයට ඇතුළත් කර තිබේ.

නව යෞවනයන් සිය දිවි නසා ගැනීමට යොමු වීම කෙරෙහි බලපෑ හේතූන් අතර ප්‍රධානතම හේතුවක් බවට පත්වී ඇත්තේ මව හෝ පියා බැණ වැදීමයි. අනෙකුත් හේතූන් අතර රෝග පීඩා, සිත් වේදනා හෝ කලකිරීම්, ක්ෂණික කෝපය, පෙම් සබඳතා පිළිබඳ ප්‍රශ්න, පවුල් ප්‍රශ්න, දෝෂාරෝපන වලට ලක්වීම, ආර්ථික ප්‍රශ්න යනාදිය විය. නව යෞවනයන් සිය දිවි නසා ගැනීමට බලපෑ හේතූන් අතර ගැහැනු පිරිමි දෙපාර්ශවයටම පොදුවේ බලපෑ හේතූන් මෙන්ම ඔවුන්ට වෙන් වෙන් වශයෙන් බලපෑ හේතූන් ද තිබෙන බව මෙම අධ්‍යයනයේ දී අනාවරණය විය.

සිය දිවි නසා ගැනීමට තැත් කළ නව යෞවනයන්ගෙන් 2/3 කට ආසන්න සංඛ්‍යාවක් සිය දිවි නසා ගැනීම සඳහා භාවිතා කළ ක්‍රමය වස පානය කිරීම බව ද මෙහි දී අනාවරණය විය. තවත් 1/4 ක් පමණ සිය දිවි නසා ගැනීමට උත්සාහ කර ඇත්තේ බටහිර ඖෂධ පානය කිරීමෙනි. ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු පැරසිට්මෝල් පෙති විශාල සංඛ්‍යාවක් එකවර පානය කිරීම තුළින් සිය ජීවිතය නැති කර ගැනීමට උත්සාහ කර තිබීම මෙහිදී දැඩි අවධානය යොමු කළ යුතු තත්ත්වයකි

මෙම අධ්‍යයනයේ දී එළැඹි නිගමනයන් ඇසුරෙන් ඉදිරිපත් කරනු ලබන යෝජනාවන් ද කිහිපයකි. ශ්‍රී ලංකාව තුළ සිදු වන සිය දිවි නසා ගැනීම් සංඛ්‍යාව අඩු කර ගැනීමේ අරමුණින් ඒ වෙනුවෙන් ක්‍රියාත්මක විය යුතු සියලු අංශ (සෞඛ්‍ය, අධ්‍යාපන, සමාජ සේවා, ජනමාධ්‍ය, ආරක්ෂක වැනි අමාත්‍යංශ) ඒකරාශි කොට සිය දිවි නසා ගැනීම් වැළැක්වීමේ මධ්‍යස්ථානයක් ඇති කොට ඒ තුළින් සිය දිවි නසා ගැනීම් පාලනය කිරීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, විවිධ මානසික ගැටලු වලට ලක්ව සිටින පුද්ගලයන්ගේ මානසික සෞඛ්‍යය යහපත් කිරීම සඳහා අවශ්‍ය උපදේශන සේවා සැපයීම සඳහා රටපුරා පැතිරුණු උපදේශන සේවා මධ්‍යස්ථාන ජාලයක් රජය මගින් ඇති කිරීම, කෘමිනාශක හෝ වල්නාශක අලෙවිය සඳහා පවත්නා නීති රීති දැඩි කොට තමන් ජදිංචි ප්‍රදේශයේ තිබෙන ගොවි සංවිධානවල නිර්දේශය මත පමණක් ඒවා නිකුත් කිරීම ආදිය මෙහිදී රජයට ඉදිරිපත් කරනු ලබන යෝජනාවන් ය.

ජීවන කුසලතා නමින් නව විෂයයක් පාසල්වල 10 - 11 ශ්‍රේණිවල උගන්වන හර විෂයන්ට ඇතුළත් කොට එම විෂය ඉගැන්වීම සඳහා විශේෂයෙන් පුහුණු කරන ලද පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව සමත් ගුරුවරුවන් යෙදවීම, ලංකාවේ පවත්නා සියලු පාසල් වල ශිෂ්‍ය උපදේශන සේවා ඒකක ඇති කොට ඒවායේ සේවය සඳහා විශේෂයෙන්ම පුහුණු කරන ලද පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාධාරී ගුරුවරුන් යෙදවීම ආදිය මෙහිදී අධ්‍යාපන අමාත්‍යංශයට ඉදිරිපත් කරන ලද යෝජනාවන් ය.

පාසල්වල සිටින ගුරුවරුන්ට හා අනෙකුත් කාර්ය මණ්ඩලයන්ට ක්‍රියාත්මක කරනු ලබන යෝජනාවන් කිහිපයක් ද තිබේ. ඒවානම්, පෞද්ගලික ගැටලු වලට මැදි වූ ශිෂ්‍යයන් හඳුනා ගෙන ඔවුන්ට මානසික වශයෙන් සහනදායි පරිසරයක් ගොඩ නැගීම, මෙවැනි සිසුන් සමග වඩාත් සමීප සම්බන්ධතා ඇති කොට ඔවුන් සමග ගැටලු සාකච්ඡා කිරීම, ඔවුන් තේරුම් ගැනීමට වෙහෙසීම හා උපකාර කිරීමට උත්සාහ කිරීම, ඔවුන්ගේ මානසික ආතතිය අඩු කිරීම, යනාදිය ඒ අතර වේ.

මෙම යෝජනා ක්‍රියාත්මක කිරීම තුළින් නව යෞවනයන් සිය දිවි නසා ගැනීමට යොමු වීම වළක්වා ගැනීමට හැකි වෙතොත් එය මෙම අධ්‍යයනය තුළින් ලද මහගු ප්‍රතිඵලයක් වනු ඇත. එය එසේ වනු දැකීම පර්යේෂකයාගේ ඉමහත් අපේක්ෂාවයි.